කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවයගිණුම්කරණ , ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	ඉඩම්වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමකින් තොරව එක් ඉඩම් ඒකකයක් රු.25 ත් 100 ත් අතර වටිනාකමක් වන පරිදි ඉඩම් ඒකක 43 ක එකතු වටිනාකම රු.2400 ක් ලෙස ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර තිබුණි.	ඉඩම් වල වටිනාකම් තක්සේරුව තක්සේරුව දෙපාර්තමේන්තුව ලවා සිදු කරවා ගැනීමට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන සභාව සතුව නොමැති අතර අදාළ ප්‍රතිපාදන රැස් කර ගැනීමෙන් පසුව මෙම කාර්ය සිදු කිරීමට කටයුතු කරන බව.	වත්කම් වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.2,379,812 ක් වූ කර්මාන්ත තැන්පත් 37 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.	කර්මාන්ත තැන්පතු 12 ක් මේ වන විට නිරවුල් කර ඇති අතර, ඉතිරි තැන්පත් පිළිබඳව කරුණු සොයා බලා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව.	තැන්පත් වටිනාකම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල මිල දී ගෙන තිබුණු එකතුව රු.475,445 ක් වූ වත්කම් අයිතම 14 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ගන්නා බව.	සියලුම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සභාව සතු වැන් රථයට සමාලෝචිත වර්ෂය තුල නව එන්ජිමක් සහ ගියර් බොක්ස් (Gear Box) එකක් සවිකිරීම සඳහා වැයකර තිබුණු රු.1,747,075 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ජර්නල් සටහන් මඟින් ප්‍රාග්ධනිත කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට වැසිකිළි ආධාර ලබා දීම රු 245,040.ක ණය හිමි ශේෂය ගිණුම් ගතකර නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී ජර්නල් සටහන් මඟින් ගළපා මෙම අඩුපාඩුව නිවැරදි කර ගන්නා බව.	කර්මාන්ත ණයහිමි වටිනාකම් නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ ආදායම්වල ප්‍රා.ස.07 වාර්තාව අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ වරිපනම් බදු, හිඟ අක්කර බදු හා හිඟ බදු කුලී ශේෂ අතර පිළිවෙලින් රු.206,804 ක, රු.2,313 ක සහ රු.833,460 ක වෙනසක් පැවතුණි.	ප්‍රා.ස. 07 වාර්තාවේ හිඟ ශේෂයන් ගණනය කිරීමේදී ඉදිරි ලැබීම්ද ඇතුළත්ව පවතී. අවසන් ගිණුම සඳහා තොරතුරු ලබාදී ඇත්තේ වරිපනම්, අක්කරබදු හා බදුකුලී ලේඛන තුලනය කිරීමෙනි. දී ඇති හිඟය ලේඛන අනුව නිවැරදි බවත් අවසන් ගිණුම සඳහා ලබා දී ඇති බදුකුලී හිඟයද ලේඛන අනුව නිවැරදි බවත් ප්‍රකාශ කරමි.	ප්‍රා.ස. 07 වාර්තාව අනුව හිඟ ආදායම්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායම් සමඟ ගැලපිය යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
උපලේඛන, ඉන්වොයිස් හා අවශ්‍ය වෙනත් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 887,359 ක් වූ ගිණුම් විෂයයන් දෙකක් සම්බන්ධයෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	අදහස් දක්වා නොමැත.	ශේෂ තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති**			
	218 රීතිය	2023 වර්ෂයේ දී වාර්ෂික ඉඩම් සමීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.	2025 වර්ෂය අවසන් වීමට පෙර මෙම ඉඩම් සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
	මු.රෙ. 571	වටිනාකම රු.889,969 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 15 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම තැන්පතු සඳහා වූ අර්ධවාර්ෂික ලැයිස්තුව සකස් කර ඇති අතර, 571 .රෙ.මු අනුව ඉදිරි කටයුතු වර්ෂයේදී 2025 සිදු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	1980 අප්‍රේල් 01 දිනැති අංක 162 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
	05 වගන්තිය	නිලධාරීන්ගේ දෛනික පැමිණීම හා පිටවීම අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් හා උචිත පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.	ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කරන අතර, එහි වාර්තා හා අත්සන් ලේඛනය අනුව අදාළ තීන්දු තීරණ ගනු ලැබේ. මෙම ක්‍රමවේදය තවදුරටත් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සිදු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම (ඌණතාවය) රු.13,267,522 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම (ඌණතාවය) රු.9,379,462 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		වර්ෂය 2024				වර්ෂය 2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය(බිල් කල ආදායමින්)	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය(බිල් කල ආදායමින්)
		රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.	රු000.
(i)	වරිපනම් හා බදු	2,297	719	623	257	2,262	2,566	2,184	383
(ii)	කුලී	4,556	5,110	4,945	51	5,015	3,832	3,779	54
(iii)	බලපත්‍ර ගාස්තු	,1875	704	704	-	1,876	740	740	-
(iv)	වෙනත් ආදායම්	29,619	10,873	10,830	44	30,269	24,723	24,629	94
	එකතුව	38,347	17,406	17,102	352	39,422	31,861	31,332	531

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ රැස්කිරීමට අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 38.35 ක් වුවත් දෙසැම්බර් 31 දින වන විට රැස්කර තිබුණේ රුපියල් මිලියන 17.1 ක් හෙවත් රැස්කිරීමට සැලසුම් කල ආදායමෙන් සියයට 45 ක් පමණි. එසේම ඇස්තමේන්තු ගත ආදායම බිල්කිරීම සිදු නොකරන බවත් ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 50 ක ප්‍රමාණයක් පමණක් බිල්කර තිබුණු බවත් ආදායම් රැස් කිරීමේ	දේපළ තහනම් කිරීමේ වැඩසටහන් සහ හිඟ ආදායම් රැස්කිරීමේ වැඩසටහන් තුළින් මෙම හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය.

කාර්යසාධනය ඉතා පහල මට්ටමක පවතින බවත් නිරීක්ෂණය කෙරේ.

(ආ) **වරිපනම් හා බදු**

2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ශේෂය වූ රු.240,772 කින් රු.128,963 ක් එනම් සියයට 54 ක් වසර 05කට වඩා වැඩි පැරණි ශේෂ විය.	2024 දෙසැම්බර් 31 දිනට වසර 05 ට වැඩි පැරණි හිඟයට අදාළ වරිපනම් දේපළ හිමි කරුවන් වෙත 2025 මාර්තු 31 දින වන විට ලිඛිතව මෙම හිඟ මුදල් ගෙවන ලෙස දන්වා ඇත. එසේ නොගෙවන අයවලුන් වෙත ඉදිරියේදී රතු නිවේදන නිකුත් කර දේපළ තහනම් කිරීමේ කටයුතු සිදු කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් කාරණා 29 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	2011 ජූනි 17 දිනැති ගැසට් පත්‍රය මඟින් අතුරු ව්‍යවස්ථා 5 ක්ද, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව , මහනගර සභා/ නගර සභා/ ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන ක්‍රියාත්මක කරමි. තවද කුකුල් කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අතුරු ව්‍යවස්ථාව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. බල ප්‍රදේශයෙහි අවශ්‍යතාවයන් අනුව ඉතිරි අතුරු ව්‍යවස්ථාවන් සම්පාදනය කොට අනුමත කරවාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව.	අතුරු ව්‍යවස්ථා පනවා බල ප්‍රදේශයේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 11 ක වටිනාකම රු.55,569,936 ක් වූ අතර එම ශේෂ තුල වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ රු.55,265,149 ක් හා වසර 5 කට වඩා පැරණි රු.304,787 ක් පැවතුණි. මෙම	හිඟ ශේෂ මෙම වසර තුළ අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	මුදල් අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.		
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ අයිතම 08 ක එකතු වටිනාකම රු.19,621,105 ක් හා කලින් ලැබීම් රු.42,788 ක් වූ අතර කාල විශ්ලේෂණයට අනුව ගිණුම් විෂයයන් 04 කට අදාලව රු.333,741 ක් වසර 05 කට වැඩි පැරණි ශේෂ විය. ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය තුල සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති හඳුනා නොගත් වියදම් ණය හිමි රු.2,833,521 ක් සහ කර්මාන්ත රු.79,449 ක සෘණ ශේෂයක් පැවතුණි.	හඳුනාගත් ණය ශේෂ මෙම වසර තුළ නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂ නිවැරදි ව හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කහටගහමුල හේන ඉඩම කට්ටිකර විකිනීමේ දී සභාවට ලැබිය යුතු පොදු ඉඩම් කොටසින් පර්චස් 26.98 ක් අඩුවෙන් ලැබීම හේතුවෙන් ඊට අදාල වටිනාකම රු.593,560 ක් මුදලින් අයකරගෙන ඉඩමේ පදිංචිකරුවන් වෙත ප්‍රතිලාභ හිමි වන කිසිදු කාර්යයකට උපයෝජනය නොකර 2020 වර්ෂයේ සිට තැන්පත් ලෙස තබාගෙන තිබුණි.	කහටගහමුල හේන කට්ටිකර විකිණීමේදී සභාවට හිමි ඉඩම් කොටස වෙනුවෙන් අයකළ රු. 593,560.00 ක මුදල තැන්පතු වශයෙන් ඇති අතර, මෙම වසර තුළ එම ඉඩම් කොටසේ පදිංචිකරුවන්ට ප්‍රතිලාභ හිමිවන ආකාරයේ සුභසාධන හෝ සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	ඉඩමේ පදිංචි ප්‍රතිලාභීන්ගේ සුභසාධනය සඳහා අදාල මුදල යෙදවිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කලමනාකරණය වෙනුවෙන් පුනරාවර්තන වැය රු.7,544,063 ක් හා ප්‍රාග්ධන වැය රු.94,205 ක් දරා තිබුණද, දිරන හා නොදිරන කසල අලවියෙන් රු.287,050 ක ආදායමක් පමණක් උපයා තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කර ගැනීමට ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්විය යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වීදි පහන් කණු විධිමත් පරිදි අංකනය කර ඒ අනුව ලේඛන ගත කිරීම සිදුකල යුතු වුවත් , එසේ සිදු කර නොතිබුණු අතර, වීදි පහන්වල ආරක්ෂාව සඳහා හැකි සෑම විටම මහජන භාරකරුවෙකු පත්කර එම තොරතුරු සභාව සතුව තබාගෙන නොතිබුණි.	වීථි පහන් කණු අංක කිරීම දැනට සිදු කරගෙන යන අතර එය , අවසන් වූ පසුව වීථි පහන් ලේඛනය යාවත්කාලීන කරන බව.	වත්කම් ලේඛන යාවත්කාලීන කළ යුතුය.

(ආ)	සභාව සතු ඉඩම් 05 ක අයිතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පවරාගෙන නොතිබූ අතර, එම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.154,096 ක වියදමක් දරා තිබුණි.	මෙහි සඳහන් ඉඩම්වල ඉදිකර ඇති ගොඩනැඟිලි සභාව සතු වන බැවින් ඒවායේ නඩත්තු සඳහා අදාළ වියදම් වාර්ෂිකව දරනු ලැබේ. මෙම ඉඩම් සභාව වෙත පවරා ගැනීමට අදාළ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව.	ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 50 ක් අතුරින් සුසාන භූමි 33 ක අයිතිය විගණිත දිනවන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	සුසාන භූමි 50 ක් පවරා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර, අදාළ මැනුම් කටයුතුද අවසන් කර ඇත. මේ වන විට සුසානභූමි 17 ක් පවරාගෙන අවසන් කර ඇති අතර ඉතිරි ඒවා ප්‍රාදේශීය ලේකම් වෙතින් පවරා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	වත්කම් කළමනාකරණය හා නඩත්තුව සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදය ආයතනයේ ප්‍රධානියා හෝ වෙනත් වගකිව යුතු අධීක්ෂණ නිලධාරියකු විසින් වරින් වර පෞද්ගලිකව සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වුවත් ,ඒ කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	වත්කම් නඩත්තුව සඳහා කර්මාන්ත අංශය මඟින් වාහන නඩත්තු සැළසුමක්ද ඉඩම් , ගොඩනැඟිලි නඩත්තු සැළසුමක්ද එම .අනුව කටයුතු කරනු ලබයි නඩත්තු සැළසුම් වරින් වර අධීක්ෂණය සඳහා භාජනය වන එය ලිඛිත ලේඛනයක් ,අතර මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	වත්කම් කළමනාකරණ හා නඩත්තු ක්‍රමවේදයන් සකසා ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුල රු 2,800,000.ක වටිනාකමකට ඉටුකිරීමට සැලසුම් කල අයවැය ගත කර්මාන්ත ක් නිම නොවී 14 පැවතුණි.	සභාවේ මූල්‍ය තත්ත්වය මත හා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ අයවැය ගත කළ කර්මාන්ත වැඩි ප්‍රමාණයක් සිදු කර ඇති බව.	අයවැය සිමාව තුල තාර්කිත පදනමකින් සැලසුම් සකස් කල යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් හා අතිරික්ත 01ක් පැවති අතර පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අනියම්, ආදේශක කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම මත බඳවා ගත් සේවකයින් 08 ක් වෙනුවෙන් සමාලෝචිත	ද්විතීයික ශ්‍රේණියේ පුරප්පාඩු පිළිබඳව වයඹ පළාත් පාලන කොමසාරිස් මඟින් අදාළ පත්වීම් හා විනය බලධාරීන් වෙත දැනුම් දී ඇතත්, අදාළ නිලධාරීන් මෙම කාර්යාලය වෙත අනුයුක්ත කර නොමැති බව හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව පුරප්පාඩු	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

	වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.1,805,148 ක් ගෙවීම් කර තිබුණි.	සඳහා බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට පියවර ගතයුතු බව දන්වා ඇති හෙයින්, ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු නොකළ බව.	
(ආ)	විනය විරෝධී ක්‍රියාවක් සිදු කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ නොවැම්බර් මස වැඩ තහනම් කරන ලද සෙවකයෙකු සම්බන්ධයෙන් අදාල විමර්ශන කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්ව නොතිබුණි.	විනය විරෝධී ක්‍රියාවක් සිදු කිරීම හේතුවෙන් වැඩ තහනම් කරන ලද සේවකයාගේ විමර්ශන කටයුතුවලට අදාලව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව.	විමර්ශන කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාෂර්ික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා පිලියෙල කර තිබුණු සැලසුම්වල ඉලක්ක ලගාකර ගැනීමේ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් ප්‍රධානම ක්‍රියාකාරකම් 19 ක් නිම කර නොතිබුණි. එසේම ක්‍රියාකාරකම් 10 ක ලගා කර ගැනීමේ ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී තාර්කික පදනමක් මත සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 06 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 15 සිට සියයට 125 දක්වාද වියදම් විෂයන් 05 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 50 කට වඩා වැඩි විචලනයක්ද පැවතුණි. ඒ අනුව අයවැය ලේඛණය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	වර්ෂයේදී මෙම අඩුපාඩු 2025 නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	අය වැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුල අයවැයගත නොකල කර්මාන්ත 38 ක් වෙනුවෙන් රු.15,606,470 ක වියදමක් දරා නිම කර තිබුණි.	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් යෝජනා කැඳවා සිදු කරන බැවින් එම කර්මාන්ත අයවැයගත කිරීම සිදු කළ නොහැකි අතර, අයවැයගත වූ සමහර කර්මාන්ත එම ලැයිස්තුවේ ඇතුළත් ව තිබූ බව.	තාර්කිත පදනමකින් සැලසුම් සකස් කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් සභාව දැනුවත්භාවයක් හෝ අවධානයක් යොමු කර නොතිබුණු අතර වර්ෂයේ දී අත්පත් කර ගැනීමට 2030 අපේක්ෂිත තිරසාර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන ඒ සඳහා අරමුණු, ඉලක්ක හා දර්ශක පිහිටුවාගෙන නොතිබුණි.	තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව 2025 වර්ෂයේ සිට අදාළ කටයුතු සිදු කරන අතර 2030 වර්ෂයේදී අත්පත් කර ගැනීමට අදාළ කාලෝචිත හා ප්‍රදේශයට උචිත පරිදි අරමුණුඉලක්ක හා , දර්ශක හඳුනාගෙන කටයුතු කරන බව.	තිරසර සංවර්ධන ඉලක්ක ස්ථාපිත කරගෙන එම ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු කළ යුතුය.